සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| සිංහල II - I | 71 | S | II | 13 ශ්‍රේණිය | පැය තුනයි |
|---|---|---|---|---|---|

**අමතර කියවීමේ කාලය මිනිත්තු 10**

විභාග අංකය -.................................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්

- I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2, 3 ප්‍රශ්න ද , ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාරදෙන්න.

---

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න .

1.1 සිංහල අක්ෂර මාලාවේ " හ " අක්ෂරය අයත් අක්ෂර වර්ගය වන්නේ,

(1) දන්තජ (2) ඕෂ්ඨජ (3) මූර්ධජ (4) තාලුජ (5) දන්තෝෂ්ඨජ (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ශිෂ්ටාචාරය , දෘෂ්ටිය, ප්‍රවීණ , සම්ප්‍රදාය
(2) ප්‍රස්ථාරය , වාර්තාව , ඓක්‍යය , වර්ධනය
(3) ලේකම් , සෞන්දර්යය , ඖෂධාලය , අත්‍යවශ්‍ය
(4) මධ්‍යසාරය , ප්‍රස්තාව පිරුළු , පරිගණකය , කෘත්‍රිම
(5) චංචල , ප්‍රාර්තනාව , සෞම්‍යය , විද්‍යාලිය (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න .

(1) විදාගම හිමි , වැත්තෑවේ හිමි , බුද්ධපුත්‍ර හිමි , රාහුල හිමි
(2) ධර්මසේන හිමි , වෛදේහ හිමි , ධර්ම කීර්ති හිමි , තිලක පිරුවන්පති හිමි
(3) විද්‍යාචක්‍රවර්ති , අත්තරගම බණ්ඩාර , බරන ගණිත , දේවපතිරාජ
(4) අලගියවන්න මුඛවැටි , විද්‍යාචක්‍රවර්ති , සේන සලමෙවන්, ගුරුළුගෝමී
(5) ධර්මානන්ද හිමි , මණිරතන හිමි , මහානාම හිමි , රණස්ගල්ලේ හිමි (......)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) අ + ඉ යන අක්ෂර සංයෝග වීමෙන් " ඓ " ශබ්දය සෑදේ.
(2) යංශයෙන් පසුව අනුස්වාරය නොයෙදේ.
(3) "ජ" හා " ඤ " යන අකුරු සංයෝගයෙන් 'ඥ'ශබ්දය සෑදී ඇත.
(4) සඤ්ඤක අක්ෂර වලින් ඇරඹෙන වචන ව්‍යවහාරයෙහි දැකිය හැක.
(5) සිංහල ස්වර මාලාව සංවෘත හා විවෘත වශයෙන් ද වර්ග කළ හැකිය. (......)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) දිවා කාලය , ළමා දිනය , කෞතුක වස්තු , සෞන්දර්ය නිකේතනය.

(2) විද්‍යා ප්‍රබන්ධ , ක්ෂණික සුවය , පෙර පුරුදු , මුසු කිරිය.

(3) අවමංගල්‍ය කටයුතු , ධර්ම දේශනා , මිනිස් වාසය , මිල දර්ශනය.

(4) ජාතක කථා , සැදෑ කාලය , වැරදි විශ්වාසය , තිළිණ ප්‍රදානය.

(5) චිත්‍ර ශිල්පය , පිළිතුරු පත්‍ර , ප්‍රධාන ශාලාව , මුද්දර ගාස්තු. (......)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) තාරකා , අබරණ , ප්‍රථම , ඝන.

(2) පැළය , විබත , ලිංග , මන්දිර.

(3) වෙහෙර , කල්‍යාණ , බාලක , සර්ව.

(4) කාන්ති , ධූම , ක්‍රීඩක , ලක්ෂණ.

(5) කවිය , ශෝකය , ශාස්ත්‍රය , නිසි. (......)

1.7 තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) දොර , පෙළ , ගොදුරු , සුව.

(2) විස , ශුභ , අහස , කරුණා.

(3) සෙල් , පැන , සිසු , මානව.

(4) දේහය , වැඳුම , ලොබ , බෙර.

(5) දුක , සඳ , පද , සවන. (......)

1.8 ද්වන්ද්වාර්ථ , අව්‍ය , විශේෂණ , විභක්ති හා අන්‍යාර්ථ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) සුරමඟ , බුදුබණ , බත්බුලත් , මුහුදසන් , සුවිසල්.

(2) බත්බුලත් , සුවිසල් , මුහුදසන් , බුදුබණ , සුරමඟ.

(3) මුහුදසන් , සුවිසල් , බුදුබණ , බත්බුලත් , සුරමඟ.

(4) සුවිසල් , මුහුදසන් , බත්බුලත් , සුරමඟ , බුදු බණ.

(5) සුරමඟ , මුහුදසන් , සුවිසල් , බත්බුලත් , බුදුබණ. (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත පද පේළිය තෝරන්න.

(1) බිඳුණ , වැටුණ , නැසුණ , ගැටුණ.

(2) හමනා , රඟනා , මැරෙනා , ලියනා.

(3) නට , බට , වට , තුට.

(4) තැලීම , දිවීම , හැඬීම , පිසීම.

(5) නැටිලි , මැසිවිලි , එරවිලි , කැවිලි. (......)

1.10 පහත දැක්වෙන තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ඉද ඉද එක වෙහෙර - විද විද දහම් මනහර

(ආ) කියන්න සුළගේ ඔබ කොයි සිටදෝ එන්නේ

(ඉ) දෙමව්පිය සිනෙහැති වඩිනුව පා පියුම් පෙති

(ඊ) සතොසින් ඇසුවොත් මෙදහම් මනහර

(1) අපර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා.

(2) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා , අපර ක්‍රියා.

(3) විධි ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා.

(4) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා.

(5) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා. (......)

1.11 තද්ධිතයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කෙවිලි, වැහැරි , දර්ශනීය , දෘෂ්ටි.

(2) සිටාණ , තෙරණු , දුර්වල , දුවණි.

(3) මාණ්ඩලික , කනකමය , දෙගිඩියා , ගම්පොළයා.

(4) ස්වකීය , අවශ්‍යතා , ශිෂ්‍යත්ව , ශ්‍රේෂ්ඨ.

(5) දක්ෂතා , අද්‍යතන , ස්වදේශීය , දෛනික. (......)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සුදන , අවශේෂ , ප්‍රබල , කුකවි.
(2) පරාජය , සංනිවේදන , අනුනායක , අභිධර්මය.
(3) දුෂ්කර , නොමනා , අකුසල් , නිර්යාත.
(4) අධිකරණ , සුරමා , ප්‍රතිගාමී , සුගත.
(5) නිදුක් , නිබඳ , නිමල , අභිචාර. (......)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) අනේ , යුෂ්මතා , පිණිස , වගා.
(2) වැළි , එම්බල , විතර , අරභයා.
(3) ගෙන් , අහෝ , දක්වා , සිට.
(4) යළි , කොල , නිති , ඇයි.
(5) සමඟ , මෙන් , බොල , විසින්. (......)

1.14 ' එකිනෙක කෙරෙහි පැවති වෛර ගිනි නිවී සිත් තුළ සංහිඳියාව වැඩී රට සංවර්ධනය වේවා 'යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලටද?

(1) සන්ධි, සමාස , තද්ධිත.
(2) සමාස , සන්ධි , තද්ධිත.
(3) තද්ධිත , සන්ධි , සමාස.
(4) සන්ධි , තද්ධිත , සමාස.
(5) තද්ධිත , සමාස , සන්ධි. (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කරන්නාහ , බලන්නාහ , නගන්නාහ , කියති.
(2) මළත් , නටත් , කපත් , කියත්.
(3) සැරසුණු , ගනු , මිදුණු , ලැබුණු.
(4) ආවේය , කෑවේය , බලන්නේය , බිව්වේය.
(5) එන්න , කියන්න , පෙනෙන්න , ලැබෙන්න. (......)

1.16 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) උණු දිය , මුව පියුම , රාජසිංහ , මල්පතර.
(2) මව්කිරි , වනමල් , තිසරණ , සිව්පිරිස්.
(3) කහබත් , තිදොර , දසපනත , ගත්කරු.
(4) අවමඟුල් , සුවිශේෂ , නොදිුණු , ඇරයුම.
(5) මැසි මදුරු , රන්පිදි , අඳ ගොළු බිහිරි , මුදුබණ. (......)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) සහෝදර , පිනැති , දැල , වාලූකාරාමය.
(2) සියත , මත්තුළු , රුක්කත්තන , වැද්දා.
(3) කම්මල , අත්තම් , ගෙත්තම් , වත්තල.
(4) මලපුන , ලිග්ගල , අද්දුටු , සිවරහ.
(5) නෙතඟින් , කම්මුල , සිගිනිහ , ගංවතුර. (......)

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය කුමක් ද?

(1) කිපියේ , මැරුයේ , නැවුයේ , පිවිසියේ.
(2) නෙක් , දක්වා , තුරු , පටන්.
(3) මීපල් , අහස්ගඟ , හෙළදිව , ලිපිදුව්‍ය.
(4) දණිස , පුනරුත් , ගෙත්තම් , වජ්පිහිය.
(5) වරල , නිහැඬියා , සෞම්‍යය , සමානතා. (......

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න?

(1) කෙනෙක් විනෝදයට නොයෙක් ගීත ගායනා කරති.
(2) දේවානම් පියතිස්ස රජතුමා දැහිමි පාලකයෙකු විය.
(3) ඔවුහු මෙසේ කියති'යි කවුරු විශ්වාස කරත් ද?
(4) අප විසින් සමඟි දම් රැකිය යුත්තෙමු.
(5) විදුහල්පතිතුමා ශිෂ්‍යයන්ගෙන් ප්‍රශ්න කළහ. (.

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) මිනිහෙක් වුනා ම රස්සාවක් කරන්න ඕනෑ .
(2) සත්‍යය කවදා හරි ජය ගනී.
(3) වැස්සත් එක්ක අතුණු හඬ ද පැතිරිණි.
(4) අපි වෙල් ඉපනැල්ලේ දුව පැන සෙල්ලම් කළෙමු.
(5) එන ගමන් අපේ ගෙදරටත් ගොඩ වෙන්න.

(ලකුණු

හතර වන පි

All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| | | |
|---|---|---|
| සිංහල I | 71 S I | 13 ශ්‍රේණිය |
| පැය තුනයි | | අමතර කියවීමේ කාලය - මිනිත්තු 10 යි |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) යන උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද ( ඌ ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න)

1.(අ) "භවත් ගෞතමයෙනි , භික්ෂුසංඝයා හා සමඟ අද අපගේ ආරාධනා නිසා අපගේ ගෙයි දී වැළඳුව මැනැව'යි කිවූ ය. බුදුහුත් බොහෝ ප්‍රයෝජන සලකා ආරාධනාවේ අරුමයක් නැතත් ඉවසා වදාළසේක. බමුණානෝ බුදුන් ඉවසා වදාළ නියාව දැන වහා ගෙට ගොසින් නැතක් දවස් නියඟ කොට තබාලා බිම තෙමා වස්නා මහා වැස්සක් මෙන් නැතක් කලක් ම තමන් කළ විරු දෙයක් නොවන හෙයින් අරුමයක් සේ දෙන දන යහපත් කොට සැරහූ ය. බුදුරදුන්වහන්සේ ද නකත්තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණ ගණ පිරිවරා බමුණන්ගේ ගෙට වැඩ පනවන ලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි චෝරජනා ළහිරුමඬලක් මෙන් වැඩහුන් සේක. භික්ෂු සංඝයාවහන්සේ ද රන් නැවක් මධ්‍යකොට පිපී වැනී ගිය රත් නෙළුම් වනයක් මෙන් වැඩහුන් සේක. බමුණානෝ ද බුදුපාමොක් සංඝයා වහන්සේ සිය අතින් සකස් කොට වැළඳූ ය. එ දවස් මිත්‍යාදෘෂ්ටිකයන්ගෙනුත් සම්‍යක්දෘෂ්ටිකයන්ගෙනුත් බොහෝ දෙන රැස් වූ ය. මේ දෙපක්ෂයෙන් මිත්‍යාදෘෂ්ටිකයෝ මේ බමුණන් ආරාධනා කොට ශ්‍රමණ භවත් ගෞතමයන් ගෙට ම කළේ නම් හුදක් දන් දෙන්ට අමුතු නොවෙයි . ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්නට ය.

i. මෙම පාඨයෙහි සඳහන් උපමාවක් උපුටා ලියන්න.
ii. මෙම ජේදයේ සඳහන් දෙපක්ෂය කවුරුන් ද ?
iii. එම කණ්ඩායම් දෙක රැස්වූයේ කුමන අරමුණුවලින් ද යන්න වෙන් වෙන් ව දක්වන්න.
iv. "චෝරජනා" යන්නෙහි අදහස දක්වන්න. (ලකුණු 04යි)

(ආ) ඒ වෙලෙහි මෑණියෝ පුතණුවන් කෙරෙහි ප්‍රේමයෙන් සතුටු කඳුළු ගෙන පියා "පුතණුවෙනි? කුමක් කියන්නෙහි ද මාගේ ඇස් දෙකත් මාගේ හදවතත් නුඹත් මේ සතර මට සම ම ය. ඒ ඇස් දෙකටත් හදවතටත් නුඹ ම ප්‍රිය දැමය'යි කීහ. අනුරුද්ධ කුමාරයෝ කියන්නාහු එසේ නුඹ වහන්සේ මට සනා ඇති කළ , මෙතෙක් දවස් මෙබඳු වූ රස ඇති නැති පූ මට පිස නොදුන්නේ නැයි කීහ. බිසොවු තලිය ගෙන ගිය පුරුෂයා අතින් විචාරා මෙපවත් දැන මාගේ පුතනුවන්ගේ පින් බලයෙන් දිව කැවුම් දෙවියෝ මවා දුන්හ යි දැන ඉතා විස්මයට පැමිණිය හ. එවෙලෙහි අනුරුද්ධ කුමාරයේ "මෑණියන් වහන්ස මා කෙරෙහි සනා ඇත්තේ සේක් වී නම් අද පටන් ගෙන සෙසු කැවුමක් නොකම්ම ය. නැති පූ මට පිස එවාලන්නැ'යි කියාලා කෙළිනට දිව පි ය. එදා පටන් කැවුම් කම්'යි පුතණුවන් එවා ලූ කල මෑණියෝ පෙර සේ ම රන් තලියක් ශෝධා, රන්තලියකින් වසා යවාලති. පෙර සේ ම දේවතාවෝ දිව්‍ය කැවුම් මවාලති. අනුරුද්ධ කුමරයෝ සෙසු කැවුම් නොකා දෙවියන් මැවූ කැවුම් ම කා නැතැයි යන බසෙහි අර්ථය නොදැන ගිහි ගෙයි වැඩුණා හ.

i. මෑණියන් පුතාණන් සමකොට දැක් වූ වස්තූන් මොනවා ද?
ii. තලිය දිව කැවුම්වලින් පිරී ගියේ කුමක් හේතු කොටගෙන ද?
iii. "එසේ නුඹ වහන්සේ මට සනා ඇති කල මෙතෙක් දවස් මෙබඳු වූ රස ඇති නැති පූ මට පිස නොදුන්නේ" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න."
iv. "දිව කැවුම්" යන යෙදුම කෙටි විවරණ සපයන්න. (ලකුණු 1x4 = 4යි)

දෙවන පිටුව බලන්න

(ඉ) සැඟවී සිටි රජ කිඳුරා මළේ වනැ'යි හෙළින් බැස තී හඬන්නට කාරණා කවරේදැ'යි .මම තී පාද පරිචාරිකා කොට දොළොස් දහසක් පුරඟනන්ට අග මෙහෙසුන් කෙරෙමි'යි යන ආකාර දැක්වී ය. කින්නරංගනා ද ඔහු දැක මේ සොරහු විසින් විඳින ලද්දේයැ'යි භය සෝක දෙකෙන් වෙව්ලමින් දිවගෙන ගොස් පර්වත මුදුනට නැඟී රජහට අවන්නට පටන් ගත් හ. ඒ කෙසේ ද යත් යම් රජෙක් මාගේ කැමති සමණන් කිසිලි මැද විද පී ද ඒ තෙම ශර වේගයෙන් තැති ගත්තේ විසංඥව බිම වැද හොත්තේ ය. අනේ මා දිවගෙන ගොස් ගල් මුදුනෙක ලා මෙසා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී මාගේ ස්වාමිපුත්‍රයාණන් මා උදෙසා මැරී නම් මාගේ ස්වාමිපුත්‍රයාට පැමිණ මරණ දුඃඛය තට වේව'යි පැමිණියා වූ මේ සෝකය තගේ අඹුවන්නට ද වේව'යි , තට ද පව්වු වූ රජ තා ගේ මව් ද තා නොදැක සොහොන් වදිවා'යි තට ද දුෂ්ට වූ තාගේ ප්‍රජාපතී තොම තමන් දරුවන් නොදැක නිරා වදී ව'යි යනාදීන් ඇවිලි අව අවා අඬන්ට පටන් ගත් හ.

i. රජ පර්වතයෙන් බැස කිඳුරංගනාවන්ට කුමක් පැවසුවේ ද?
ii. රජු ස්වාමියාට විඳීම හා සමානව කිඳුරිය දුකට පත් වූ අනෙක් කරුණ කුමක් ද?
iii. " ඒතෙම ශර වේගයෙන් තැති ගත්තේ විසංඥව බිම වැද හොත්තේ ය," මේ උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. 'රජහට අවන්නට' යන පදයට කෙටි විවාරණ සපයන්න . (ලකුණු 1x4= 4යි)

(ඊ) එකල්හි රජ්ජුරුවෝ සිව නම් අමාත්‍යයකු කැඳවා මාවටු පටුන්ගම ප්‍රධානව ඉද අයබදු පඩුරු දෙන සේ සලස්වා සනුමාන දී නික්ම වූ හ. ඒ අමාත්‍යා අතරමග සිට එ පවත් කියා යැවී ය. එකල මාවටු පටුනෙහි මනුෂ්‍යයෝ වීථි හැම කැළි කසළ හරවා අලංකාර කොට ධජ පතාක නංවා දොරකඩක් පාසා පූර්ණ ඝට හා මරුක්මලින් සරහා පූර්ණ කලස තබ්බවා මහ වේ දෙපස හිරිකුඩම් තනා වැට පහන් ලවා සියලු වීථි මාර්ගය එක හෙළා සරහා තබා හැම දෙන ම ඉදිරියට ගිය හ. එකල ඒ අමාත්‍යයා ඉස් ශෝධා නහා සියලු වස්ත්‍රාලංකාරයෙන් සැරහී මුදුනෙහි වියන් බැඳ සුවඳ මල් දම් එල්වා සරහන ලද රථවාහනයකට නැඟී මහා සෙනඟ පිරිවරා මාවටු ගමට වැද වීථි සැරහීම් බල බලා නුවර ප්‍රදක්ෂිණා කොට නික්මුණු මහ රජෙකු සේ ගොසින් නන්දිය නම් වෙළඳාණන්ගේ ප්‍රාසාද සමීපයට පැමිණියේ ය. එකල නන්දිය වෙළෙන්දන්ගේ භාර්යාවෝ උත්සවය බලනු සඳහා ඉස් ශෝධා නහා සර්වාභරණයෙන් සැරහී දාසි සමූහයා පිරිවරා එක් දාසියක ඇඟ එල්බ ගෙන ශරීර භාගයක් පෙනෙන සේ මතු මහල් තෙලෙහි උත්සවය බල බලා සිටිය හ.

i. රජතුමා සිව නම් අමාත්‍යයා කැඳවා පැවරූ කාර්යය කුමක් ද ?
ii. නන්දිය වෙළඳාණන්ගේ භාර්යාව උත්සවය බල බලා සිටියේ කෙසේ ද?
iii. " දොරකඩක් පාසා පූර්ණඝට හා මරුක්මලින් සරහා පූර්ණ කලස් තබ්බවා....... " මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ' ප්‍රදක්ෂිණා ' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1x4=4යි)

(උ) දියත සතන් මන බැඳි වැදි සභයේ
කියත නොයෙක් විරුදාවලි සතොසේ
දිගත බිහිරි කර යුග සිඳු ගොස සේ
කරත පසඟතුරු ගොස සිට දෙපසේ

එක්ව සිනිඳු වල් විදූනා සුළඟින්
නික්ම දිවෙන ඉඳුවර දම් සරණින්
සක්ව දිලෙන අබරණ රැස් තරඟින්
නික්ම එරජ රජ මැති සෙන් සමඟින්

i. දියත සතන්ගේ සිත් බැඳගත් සිදුවීම කුමක් ද ?
ii. කල්පාන්ත සමුද්‍ර ඝෝෂාව මෙන් ඇසෙන්නේ මොනවා ද?
iii. "සක්ව දිලෙන අබරණ රැස් තරඟින්
නික්ම එරජ රජ මැතිසෙන් සමඟින් "
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. " ඉඳුවර දම් " යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1x4= 4යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) "තොප මට සිනාසෙන්ට කාරණා කිම ද?"
(ii) " මුඹ වහන්සේ අනුශාසනාවෙහි උතුම් කවරේ ද ?"
(iii) " ලදොත් ජීවත් වන්නා මුත් නොලදොත් ජීවිතය හරිමි "
(iv) " තොප හැමට මෛත්‍රිය හා සමාන පිළිසරණෙක් නැත "
(v) " සටන් කරපල්ලා සහෝදරයිනේ තැග්ග ලස්සනයි "
(vi) " මා සමිඳුන් නැති අතරේ - කෙලෙස ද මා බැහැර යන්නේ"
(vii) " ජීවිතය ඔහොම තමයි මල්ලී , මමත් ඔය වගේ ම දුක් විදපු කෙනෙක් " (ලකුණු 3x4=12යි)

(ඊ) පද්‍ය නිර්මාණයක සාර්ථකත්වය උදෙසා කාව්‍ය අන්තර්ගතය හා භාෂාව භාවිතය ඉවහල් වන ආකාරය අවධානයට ගෙන පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මී සුණු කුසුම් රොන් මුසු නල සුව දැනවී
මේ දූ නු රැගෙන එයි මා අබියස මලවී
වා ව නු නොහැක නැතිව ද ගී හඬ කුරවී
පායනු මැනවී ! අඩ සඳ , පායනු මැනවී

පි ඩු කළ අමා තරුණියකගේ අදර යුගෙන්
අ ඩු වැඩි නොකර ගත හැකි බව උගෙන මගෙන්
ප ඩු පැහැ මවා රන් මුසු කර වැඩි ව අගෙන්
උ ඩු තොල ඇයගේ පිළිරුවකට රැගෙන නැගෙන්

ප වු නළලකට දළසිඹු ඉසි කරන නිසා
ගො වු ව ක අමා බහමින් වෙල වියන වසා
තු වු ක ර ඔහුව අප වැනි අය ගැනම අසා
බ වු වැනි ඔබත් ලොව පැවතුණ අඳුර නසා

ස ව ස ට මුවර දද සහ විත් කිරණ ගලා
සු වු දුක් අසා තරුණියකගේ මුහුණ බලා
ම ව පන්! නළල ඉන් පසු යන අතර කලා
මු ව ඇගේ මවන හැටි එයි හුරු පුරුදු වෙලා

ම ගෙ සුන් දරිය කන අබරණ ඉහත තැනූ
පි ළි ගත් නෝ වත් නැත එහෙයින් තරග වෙනූ
සු ර ඹුන් කනට කොයි කවදත් ලකර වුනූ
ග න රන් තෝඩුවක හැඩහුරු කමට එනූ

පු න් පියොවුරට තරගයකැයි සිතට දැනී
සු න් දර සුරඹ පෙති පෙති කැපූ වියරු ගැනී
ර න් තැඹිලියක ඇස්සක් නුඹ පතිත විඬී
ඉ න් ඔබ මැවුණු බව කවියා හොඳට දනී

රූ ම ති යන්ගේ මුව කඹරට පැරද යති
දෑ කැ ති හඳමු කපනට සර වනය නිති
මේ ග ති යකින් සුරඹුවෝ සුර ලොවෙහි ඇති
පා ද ති ඔබව හැඩහුරුකම ගැන ද සිති

රැ ට ත් වදුලුවල තුරු කොළ විජිනි පතින්
මී ක ත් තොමෝ මදනල දී ඔබගෙ ගතින්
ආ යෙ ත් ගිමන් නිවමින් ඇති හෙයිනි ඉතින්
බී ම ත් වන්න ! කුමුදක රස කිරණ විතින් (ලකුණු 12යි)

2. "ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලිය අතිවිශිෂ්ට ගද්‍ය කාව්‍ය කෘතියකි.". කතුවරයා තම කෘතිය විශිෂ්ටත්වයට පත්කරගෙන ඇත්තේ කවරාකාර භාෂා උපක්‍රම මඟින් ද යන්න අදාල කතා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

නැතහොත්

ජාතක කතා පොතෙහි බහුලව ඇත්තේ හේතුඵල සම්බන්ධය අනුව සිදුවන සිදුවීම් සහිත කතා ය. ඒවා ලියවී ඇත්තේ "යථාර්ථ රීතියෙනි" නියමිත කතා දෙක ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

3. (අ) ගම්පොළ අවධිය සිංහල ගද්‍ය සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් කෙබඳු ස්වරූපයක් විදහා පාන්නේ ද යන්න අදාළ ග්‍රන්ථ තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07යි)

(ආ) "සද්ධර්මාලංකාර කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූයේ සමාජය තුළ ගුණ ධර්ම පෝෂණය කිරීමයි" නියමිත කතා ඇසුරෙන් මේ කියමන විග්‍රහ කරන්න. (ලකුණු 08යි)

නැතහොත්

(අ) සිංහල ගද්‍ය සාහිත්‍ය සම්බන්ධයෙන් දඹදෙණි සාහිත්‍ය අවධිය කවර ස්වරූපයක් දරන්නේද යන්න ගද්‍ය ග්‍රන්ථ තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

(ආ) ගොවිතැන හා වෙදකම විෂයෙහි අතීත ජනයා තුළ පැවති දැනුම් සම්භාරය ඉතා විචිත්‍ර ව දක්වන්නට පූජාවලි කතුවරයා ගත් උත්සාහය නිර්දිෂ්ඨ කතා වස්තු ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 08යි)

4. ගුත්තිල කාව්‍ය චිත්තාකර්ෂණීය කාව්‍ය රචනයක් මෙන් ම කාලීන සමාජය පිළිබඳ තොරතුරු හෙළි කරන කෘතියක් වශයෙන් ද වැදගත් වෙයි. වර්ණනා දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

5. ගැමි පසුබිම තේමා කොටගෙන චරිත හා සිද්ධිදාමයක් දේශියත්වයට ගැළපෙන ආකාරයෙන් කලාත්මකව ප්‍රතිනිර්මාණය කිරීමට කතුවරයා දක්වන කුසලතාව "බැද්දේගම"නවකතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

6. සහෝදර ප්‍රේමය දරු සෙනෙහස හා සත්ත්ව කරුණාව යන මනෝභාවයන් ඊට උචිත අවස්ථා හා සිදුවීම් මඟින් පාඨකයා වෙත පමුණුවාලීම සඳහා කෙටිකතාකරුවන් ගත් ප්‍රයත්නය නියමිත කෙටිකතා තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

7. රසිකයා තුළ වින්දනයක් ඇති කිරීමට මෙන් ම සංකීර්ණ ජීවිත යථාර්ථය ඉදිරිපත් කිරීමට ද දරන ප්‍රයත්නය විදහාපාන නිර්මාණ ගණනාවක් නූතන පද්‍ය සංග්‍රහයේ අන්තර්ගත වේ . මේ පිළිබඳ ඉගිලෙන සිහින , දුරු රට ගිය පුතු , පොඩි දුව යන පද්‍ය පන්ති ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

8. කාව්‍යමය ලෝකයේ හුදෙකලා වූ තැනැත්තකු සැබෑ ලෝකයට පිවිසෙන අයුරු උද්දාල චරිතයෙන් නිරූපණය කිරීමට සරච්චන්ද්‍රයන් දැරූ ප්‍රයත්නය ප්‍රේමතෝ ජායතී සෝකො නාට්‍ය ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15යි)

***

**අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024**

| සිංහල II | 71 | S | II | 13 ශ්‍රේණිය |
|---|---|---|---|---|

## II කොටස

මෙම කොටසින් **2,3** ප්‍රශ්න ඇතුළු ව <u>ප්‍රශ්න හතරකට</u> පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සැබවින් ම පරිවර්තනයක් යනු ස්වතන්ත්‍ර නිර්මාණයක් කරනවාට වඩා ඉතාමත් බැරෑරුම් වූ කර්තව්‍යයක් බව එක හෙලා ම පිළිගත යුතුය. පරිවර්තන කර්තව්‍යයේ නොයෙදී මතුපිට අර්ථය ගෙන කරන පරිවර්තනය යනු "එක් භාෂාවකින් තවත් භාෂාවකට පෙරළීම පමණකැ'යි හඟින අය හැර පරිවර්තන කාර්යයේ නියුතු ඕනෑම අයෙක් මෙම ප්‍රකාශය සමග එකඟ වෙති. ස්වතන්ත්‍ර නිර්මාණයකදී නිර්මාණකරුවාට අවැසි වචනය අදාළ අවස්ථාව තමන්ට හැඟෙන පරිදි භාවිත කිරීමේ ,විග්‍රහ කිරීමේ හැකියාව ඇත. එහෙත් පරිවර්තකයාට එවන් නිදහසක් කොහෙත් ම නොලැබෙයි. උදාහරණයකින් කියන්නේ නම් ස්වතන්ත්‍ර නිර්මාණය ගැමි තැනිතලා ප්‍රදේශයක් මැදින් වැටී ඇති පැය දෙකකට සැරයක් වාහනයක් ධාවනය වන තාර පාරක දුවන බසයක් වැනි යයි කිව හැකිය. අවැසි නම් ඒ බසයට සම්පූර්ණ පාර ම තමන්ගේ මාවත කොට ගත හැකිය. වෙනත් වාහනයක් තමන් පසු කරන විට හෝ තමන්ට ඉදිරියෙන් එන විට හෝ පමණක් තමන්ට අදාළ වම් පසෙහි අදාළ මාර්ග සීමාව පාවිච්චි කළ හැකිය. රියදුරා දක්ෂ නම් සිග් සැග් ගසමින් වුව ධාවනය කළ හැකිය. කඳු හෙල් , තැනිතලා භූමියක් නිසා තාර පාරෙන් මදක් ඉවත් ව තණකොළ බිමෙහි වුව ද ගියාට වරදක් නැත .එහෙත් පරිවර්තකයාගේ ගමන ඊට වඩා දුෂ්කර ය. එය පූර්ව නිශ්චිතය. එනම් එල්ලේ ම සමාන වනුයේ රේල් පීලි දෙකක ගමන් කරන දුම්රියකට ය.

i. පරිවර්තන ග්‍රන්ථයක් පිළිබඳව මෙහි දැක්වෙන වැරදි මතය කුමක් ද?
ii. ගැමි තැනිතලා ප්‍රදේශයක ධාවනය වන බසයකට සමාන කොට ඇත්තේ කුමක් ද?
iii. සාර්ථක පරිවර්තකයා ඉතා දුෂ්කර කාර්යයක යෙදෙන බව කීමට යොදා ඇති උපමාව කුමක් ද?
iv. අවැසි වචන අදාළ අවස්ථාවට තමන්ට හැඟෙන පරිදි භාවිතා කිරීමේ හැකියාව ඇත්තේ කවර රචකයකුට ද ?
v. මෙම ඡේදයෙන් ප්‍රකාශ වන්නේ කුමන ක්‍රියාවලියක් පිළිබඳව ද ?
vi. තමා විසින්ම සම්පාදනය කරන , යම්කිසි කටයුත්තක් යන පාඨ සඳහා ඡේදයේ සඳහන් තනි පද දෙක උපුටා දක්වන්න.

(ලකුණු 2x6 = 12යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව <u>තුනෙන් එකක් පමණ වන සේ</u> සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සාහිත්‍යකරුවා තමාගේ අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මගිනි භාෂාව වූ කලි අදහස් හා හැඟීම් ගෙන යන වාහකයා යි. ලේඛකයා තම හදවත කම්පනය කළ අත්දැකීමක් ප්‍රතිනිර්මාණය කරන්නේ වචන අනුසාරයෙනි./සාහිත්‍ය වනාහි භාෂාත්මක වික්‍රමයකි. සාහිත්‍යය භාෂාත්මක වික්‍රමයක් හෙයින් ප්‍රතිභා සම්පන්න ලේඛකයකු සතු ගුණාංගයක් විය යුත්තේ භාෂාධිපත්‍යය යි. තමාට අභිමත පරිදි බස හසුරවා ගැනීමේ ශක්තියක් ඔහුට තිබිය යුතුය. එහෙයින් ලේඛකයෙකුගේ නිපුණතාව බොහෝ දුරට ප්‍රකට වන්නේ ඔහු භාෂාව ස්වකීය කාර්ය සාධනය සඳහා වහල්කොට ගන්නා ආකාරයෙන් බව කිවමනා ය.

සාහිත්‍යකරුවා උපයෝගී කොට ගන්නා භාෂා මාධ්‍යයෙහි කිසියම් විශේෂතාවයක් ඇත.එම විශේෂත්වය ප්‍රත්‍යක්ෂ කොට ගත හැක්කේ සාහිත්‍යකරුවන්ට අන්‍ය තර වූවන් භාෂාව පරිහරණය කරන ආකාරය පරීක්ෂා කිරීමෙනි /සාහිත්‍යයික භාෂාවේ විශේෂත්වය වූ කලී එහි ඇති භාවික ගුණයයි. පාඨකයාගේ භාවයන් ප්‍රබෝධ කොට ඔහු අත්දැකීමකට සහභාගී කරවා ගැනීමේ ශක්තියයි/ ප්‍රතිභා සම්පන්න ලේඛකයකු අපූර්වත්වයෙන් යුක්ත භාෂාවක් නිර්මාණය කිරීමට අමුතුවෙන් වෙහෙස වන්නේ නැත. එහෙත් සමහරු ඉතා කෘතිම ආකාරයට එම අපූර්වතාව ඇති කිරීමට වෑයම් කරති./පද්‍යයට ම විශේෂී වූ වචන මාලාවක් ඇතැයි සමහරු කල්පනා කරති ඒ නිසා ම බැලූ බැල්මට සුන්දර යැයි පෙනෙන වචන ඔවුහු පද්‍යකරණය සඳහා යොදා ගනිති එහෙත් එබඳු සුන්දර වචන යෙදීමෙන් ම කාව්‍ය භාෂාවේ භාවපූර්ණත්වයක් ඇති නොවේ. කාව්‍ය භාෂාව අත්දැකීම සමග අත්‍යන්තයෙන් ම බැඳී පවතින්නක් විය යුතුය. නිර්මාණාත්මක සාහිත්‍ය කෘතියක් එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීම දුෂ්කර වන්නේ ඒ හෙයිනි

(ලකුණු 13යි)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

   i. තරුණ ගැටලු විසදීමට උපදේශනයෙහි අවශ්‍යතාව.

   ii. අධිවසංගත ඩෙංගු උවදුර මර්දනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් තිබිය යුතුය.

   iii. කායික මානසික සමබරතාව කෙරෙහි ක්‍රීඩාව මගින් ඇතිවන බලපෑම.

   iv. වැඩ වර්ජන නිසා රට ද ජනතාව ද පත්වන දුෂ්කරතාව.

   v. බස නිවැරදිව හැසිරවීම විද්‍යුත් මාධ්‍යයෙහි වගකීමකි.

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න .

   i. නංගී ද මල්ලී ද මම ද විනෝද චාරිකාවට සහභාගී වුණාහ.

   ii. තරගය අවසානයේ ජයග්‍රාහකයෝ ජයඝෝෂා නගද්දී පරාජිතයෝ දුක් වූහ.

   iii. කුමාරතුංග මුනිදාසයෝ හෙළ බස රැකීමට පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේය.

   iv. හෙතෙම ගව ගණනක් දුර ගෙවා පිට්සර දනව්වකට පැමිණියාහ.

   v. දෙව්හනක් වැනි කාන්තාවක් සභාවේ අසුන්ගෙන සිටියාය.

(ආ) පහත වාක්‍ය <u>කර්මකාරකයට</u> හරවන්න.

   i. නාහිමියෝ පින් අනුමෝදන් කරති.

   ii. කථානායකවරයා පාර්ලිමේන්තුව කල් දැමුවේය.

   iii. ලේඛිකාවෝ සම්මාන දිනා ගත්හ.

   iv. සුභසාධක සංගමය සාමාජික සාමාජිකාවන් දැනුවත් කරයි.

   v. සිසුහු පුස්තකාලය පරිහරණය කරති.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

   i. විභාග කඩඉම ජයග්‍රහණය සඳහා තම ( ශිෂ්‍යයන් / ශිෂ්‍යයෝ ) නිවැරදි ඉලක්ක කරා ගෙන යෑමට (ගුරුවරුන් /ගුරුවරු) දැඩි කැපවීමෙන් ක්‍රියා කළහ.
   ii. වැඩ වර්ජනයට සහභාගී වූ (සේවකයන් / සේවකයෝ) සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට (ප්‍රධානීන් / ප්‍රධානීහු) එකඟ වූහ.
   iii. (සමහරෙක් /සමහරකු) ඇල්මෙන් අකුරු (උගනිති / උගනියි.)
   iv. බ්‍රහ්මදත්ත (රජු / රජහු ) වූ දඹදිව තලය සිය අණසකට යටත් කර (ගත්හ / ගන්නා) ලදී.
   v. රැස්වීමට සහභාගී වූ (මිනිසුන් /මිනිස්සු ) පාසල පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත (වූහ /විය )

5. පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය ලියා දක්වන්න.

   i. <u>අද්‍යතන</u> සාහිත්‍යකරුවෝ විවිධ තේමාවන් <u>අනුව</u> <u>ප්‍රබන්ධ</u> කතා ලියූහ.

   අද්‍යතන - තද්ධිත , අනුව - නිපාත , ප්‍රබන්ධ - සමාස

   ii. <u>මහාමාත්‍ය</u> තෙමේ <u>සමරු ඵලකය</u> නිරාවරණය <u>කරද්දී</u> පිරිස අත්පොළසන් දුන්හ.
   මහාමාත්‍ය - සන්ධි , සමරු ඵලකය - සමාස , කරද්දී - ක්‍රියා
   iii. <u>පොසොන් පොහොය</u> නිමිත්තෙන් <u>දර්ශනීය</u> තොරණ ඉදිකර <u>ප්‍රදර්ශනය</u> කරන ලදී.
   පොසොන් පොහොය - සමාස , දර්ශනීය - ප්‍රත්‍යාර්ථනාම , ප්‍රදර්ශනය - අව්‍ය පද
   iv. උත්සවයට <u>පැමිණි</u> සියලු දෙනාට <u>බතබුලතින්</u> සංග්‍රහ <u>කෙරිණි.</u>
   පැමිණි - ප්‍රත්‍යාර්ථනාම , බතබුලතින් - සමාස , කෙරිණි - ක්‍රියා
   v. <u>කාව්‍යෝචිත</u> භාෂා මාධ්‍යයක් <u>සකසා</u> ගැනීමට <u>කවීන්</u> අත්හදා බැලීම් කරන ලදී.
   කාව්‍යෝචිත - සන්ධි , සකසා - ක්‍රියා , කවීන් - විභක්ති

(ලකුණු 15යි)


හයවන පිටුව බලන්න

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(ඉතිහාසය , ධෛර්යයෙන් , නිරීක්ෂණය , භෞතික , දිරියෙන් , උපදේශාත්මක )

i. ලෝකෝපකාරය නම් ................................ කාව්‍ය ග්‍රන්ථය රණස්ගල්ලේ හිමියන් විසින් රචනා කරන ලදි.
ii. තාරකා විද්‍යාඥයා තම දුරේක්ෂයකින් අහස ........................................ කළේය.
iii. රටක සංවර්ධනය යනු ................................මෙන් ම සදාචාරාත්මක දියුණුව බව සමහරු පවසති.
iv. මෙරට සෙල්ලිපි ........................................ අනුරාධපුර යුගය දක්වා විහිදෙයි.
v. ප්‍රඥාවන්තයෝ ........................................ යුක්තව අභියෝගවලට මුහුණ දෙති.
vi. අලසකම දුරලා ............................................ වැඩ කළොත් ජයග්‍රහණය ස්ථිරය

(ලකුණු ½ x 6 = 03 යි)

(ආ) පහත දැක්වෙන වාක්‍ය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

"ලංකාවට විජය කුමරු එක්ක ආව කට්ටිය කසවතුර සංග්‍රහයක් දුන්න බව මහාවංශයේ සඳහන් වේ"

(ලකුණු ½ x 6 = 03 යි)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්තිය නම් කරන්න.

i. **දරුවන්ගේ** අධ්‍යාපනයට අවශ්‍ය දේ රජය විසින් සැපයේ.
ii. **ප්‍රේක්ෂකයිනි** ඔබ කරුණාකර ශාලාවෙන් ඉවත් වන්න.
iii. සැකකරුවන් පිළිබඳ සියලු තොරතුරු **පොලිස් පොතෙහි** සටහන්ව ඇත. (ලකුණු ½ x 6 = 03යි)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලකුණු යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

i. අනුරාධපුර කෝට්ටේ රාජධානිය තෙක් තොරතුරු ඇතුළත් රාජාවලිය මහාවංශය හා දීපවංශය අග්‍ර ගණයේ ග්‍රන්ථ වේ.
ii. කාර්යාලයේ වැඩ නිම වූ පසු මම ඉක්මනින් ම ගෙදර එමි යි තාත්තා කීවේය.
iii. පාසල් දරුවෝ පිටි සීනි බහුල ආහාර ගැනීම නිසා විවිධ රෝග වලට ගොදුරු වී ඇතැ යි වෛද්‍යවරු පවසති. (ලකුණු ½ x 6 = 03යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. "මට කෑම දෙන්න" යැයි කිළිණ අම්මාගෙන් ඉල්ලීය.
ii. "දැන් සනීප දැයි" වෛද්‍යවරයා රෝගියාගෙන් ඇසීය.
iii. "ස්වාමීනි, මට අනුකම්පා කළ මැනවයි" මගියා ඉල්ලා සිටියේය. (ලකුණු 1 x 3 = 03යි)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පරමධම්මචේතිය ආයතනයෙහි ව්‍යුහය ,තදීය විෂය මාලාව හා නිර්දිෂ්ට ග්‍රන්ථාදිය පිළිබඳ ව තොරතුරු අප්‍රකට ය. එසේ හෙයින් අපට එළැඹිය හැකි නිගමනය නම් පරමධම්මචේතිය ශාස්ත්‍රායතනය වූ කලී සංවිහිත අධ්‍යාපන ආයතනයක් නොව තත්කාලීන සම්ප්‍රදාය පරිද්දෙන් වියත් භික්ෂුවකගේ මූලිකත්වයෙන් නවක භික්ෂූන් ශාස්ත්‍රාගමයෙහි නිරත කරවීමේ අධ්‍යාශයෙන් පවත්වාගෙන යනු ලැබුවක් පමණක් බවයි. පන්සල් කේන්ද්‍රකොටගත් මෙබඳු ආයතන යටත් විජිත සමාජ බලවේගවලට ප්‍රතික්‍රියා වශයෙන් ඇරඹි විද්‍යෝදය විද්‍යාලංකාර ද්වයය ආරම්භ කිරීමෙන් අනතුරුව ද පැවති අතර ඒවායේ තත්ත්වය පිළිබඳ ව වර්ෂ 1888 දී අධ්‍යාපන අධ්‍යක්ෂ ඩබ්ලිව්.එච්.ග්‍රීන් විසින් පවසා ඇති කරුණු කෙරෙහි මදක් විමසිලිමත් විය යුතු යැයි හැඟේ

ක , ඵ , ෆ , ඞ


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

i. තද කළු අකුරෙන් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

ii. නිර්දිෂ්ට ,
තොරතුරු ,
තත්කාලීන යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

iii. උපසර්ගයක් සහිත පද තුනක් ඡේදයෙන් උපුටා ලියන්න.

iv. ග්‍රන්ථාදිය , ශාස්ත්‍රායතනය , විද්‍යෝදය යන වචන විසන්ධි කරන්න.

v. මේ ඡේදයේ ඇතුළත් යංශයක් හා දන්තජ ඝෝෂ මහාප්‍රාණාක්ෂරයක් අන්තර්ගත වචනයක් උපුටා ලියන්න.

(ලකුණු 3x5=15 යි)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. අව්‍යය සමාසය

ii. පූර්ව ක්‍රියා

i. පූර්ව රූප සන්ධිය

iv. භාව කාරක කෘදන්ත

v. ඌෂ්මාක්ෂර (ලකුණු5x3=15 යි)

PAST PAPERS WIKI

(11) WWW.PastPapers.WiKi (11)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න